# නූතන සිංහල අක්ෂර මාලාව (පාඩම 8)

| | | | | | |
|---|---|---|---|---|---|
| අ | ආ | ඇ | ඈ | ඉ | ඊ |
| උ | ඌ | ඍ | ඎ | ඏ | ඐ |
| එ | ඒ | ඓ | ඔ | ඕ | ඖ |
| අං | අඃ | | | | |
| ක | ඛ | ග | ඝ | ඞ | ඟ |
| ච | ඡ | ජ | ඣ | ඥ | ඦ |
| ට | ඨ | ඩ | ඪ | ණ | ඬ |
| ත | ථ | ද | ධ | න | ඳ |
| ප | ඵ | බ | භ | ම | ඹ |
| ය | ර | ල | ව | | |
| ශ | ෂ | ස | හ | ළ | ෆ |

## *ස්වර අකුරු හඳුනා ගනිමු*

තනිව උච්චාරණය කළ හැකි අකුරු ස්වර වේ.

මේවා පණකුරු, ප්‍රාණාක්ෂර යනුවෙන්ද හඳුන්වනු ලබයි.
පණකුරු දහ**18**කි.

***ක්‍රියාකාරකම 1***

පහත දැක්වෙන වගුවෙහි අඩු ස්වර අකුරු සම්පූර්ණ කරන්න.

| | | | | | |
|---|---|---|---|---|---|
| අ | | | ඈ | | |
| | ඌ | | | ඏ | |
| | | ඓ | | ඕ | |

## ස්වර අකුරු ප්‍රධාන කොටස් තුනකි,

### ➢ *කෙටි ස්වර*

කෙටි ස්වර 8කි.

මේවා කෙටි ස්වර , ලඝු ස්වර, ලුහු ස්වර, හස්ව ස්වර ලෙස ද හඳුන්වයි. ඒවා උච්චාරණයට ගත වන කාලය අඩුය.

***ක්‍රියාකාරකම 2***

**කෙටි ස්වර භාවිතා කර වගුව සම්පූර්ණ කරන්න.**

| | | | |
|---|---|---|---|
| අ | | | උ |
| | ඏ | | ඔ |

### ➢ *දීර්ඝ ස්වර*

මේවා දික් ස්වර, ගුරු ස්වර ලෙසත් හඳුන්වනු ලබයි.
මේවා උච්චාරණයට ගතවන කාලය කෙටි ස්වර වලට සාපේක්ෂව වැඩිය.

***ක්‍රියාකාරකම 3***

**දීර්ඝ ස්වර භාවිතා කර වගුව සම්පූර්ණ කරන්න .**

| | | | |
|---|---|---|---|
| | ඈ | | ඌ |
| | ඐ | ඒ | |

### ➢ *මිශ්‍ර ස්වර*

මේවා සංයුක්ත ස්වර ලෙස ද හඳුන්වනු ලබයි.

සැදෙන්නේ ස්වර දෙකක් එක්වීමෙනි.

අ + එ - ඓ

අ + ඔ - ඖ

***ඇගයීම***

අක්ෂර මාලාව මතකයෙන් ලියන්න. නිර්මාණාත්මකව සකසා අප වෙත එවන්න.